**කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 10 - 2024**

**--------------------------------------------------------------------**

**1. විගණන මතය**

1.1 කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 10 ක 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන,මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 10 කට අදාළව විගණන වාර්තා නිකුත් කර තිබුණු අතර, එම විගණන වාර්තා 10හි ම තත්ත්වාගණනය කළ මතයන් ප්‍රකාශ කර තිබුණි. තත්ත්වාගණනය කළ මතයන් ප්‍රකාශ කිරීම සඳහා හේතු වී තිබුණු ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ඇතුලත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 07 ක 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය ප්‍රකාරව ක්ෂය ප්‍රතිපත්තිය සකසා වත්කම් ක්ෂය කිරීම් සිදු නොකර වෙනත් ක්ෂය ප්‍රතිශතයන් අනුව ක්ෂය ගණනය කර තිබුණි. | අදා චක්‍රලේඛය අනුව ක්ෂය කිරීම් මෙතෙක් සිදු කර නොතිබුණු අතර, ඉදිරි වර්ෂවල චක්‍රලේඛය අනුව ගණනය කර ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව ක්ෂය ප්‍රතිපත්තිය සකසා ක්ෂය කිරීම් ගණනය කර ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 05 ක සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රකාශවල අක්කර බදු ආදායම් ගිණුම් ගත කිරීමේදි, උපචිත පදනම අනුගමනය නොකර මුදල් පදනම මත ගිණුම් ගත කර තිබුණු බව නිරීක්ෂණ විය. | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවල අක්කර බදු ආදායම් ගිණුම් ගත කිරීමේදි, මුදල් පදනම මත ගිණුම් තබා ඇත. | අක්කර බදු ආදායම් ඇතුලු සියලු ආදායම් උපචිත පදනම මත ගිණුම් ගත කළ යුතුය. |

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 07 ක සමාලෝචිත වර්ෂයට අදාළව ලැබියයුතු අක්කර බදු ආදායම් රු.968,799 ක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ ආදායමක් වශයෙන් සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ලැබිය යුතු ආදායමක් වශයෙන් දක්වා නොතිබුණි. | ඉදිරි මුදල් වර්ෂයේ ගිණුම්වල නිවැරදිව දැක්වීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ වර්ෂයට අදාළ අදායම්,වර්ෂයේ ආදායම් වශයෙනුත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ලැබීය යුතු ආදායම ජංගම වත්කම් වශයෙන්ද දැක්වීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 10ක සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම්වල වටිනාකම දැක්වීමේදී පිරිවැය වටිනාකමින් සමුච්චිත ක්ෂය අඩුකර දැක්විය යුතුවූවත්, සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂය පමණක් අඩුකර දැක්වීමෙන් ස්ථාවර වත්කම්වල වටිනාකම රු.8,952,516 කින් වැඩියෙන් දක්වා තිබුණි. | ශුද්ධ වටිනාකම් ගිණුම්වල මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා ඇත. . | වත්කම්වල පිරිවැය වටිනාකමින් සමුච්චිත ක්ෂය අඩුකර ශුද්ධ වටිනාකම ගිණුම්වල දැක්විය යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 05 කට අයත් ගොඩනැගිලි වල වටිනාකම රු.31,845,000 ක් ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදි මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කරනු ලැබේ. | මධ්‍යස්ථානය සතු ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ගොවිජන සේවා කාරක සභා 03ක ගබඩාවල රඳවා තිබූ කිලෝ ග්‍රෑම් 89,046 සහ ලීටර් 322 ක සහනාධාර පොහොර වර්ග හතරක වටිනාකම මූල්‍ය ප්‍රකාශවල අවසන් තොග ලෙස දක්වා නොතිබුණි. | දිස්ත්‍රික් නියෝජ්‍ය කොමසාරිස්ගේ උපදෙස් අනුව ක්‍රියා කරනු ලැබේ. | කාරක සභාව සතුව පවතින පොහොරවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඉ) | කිලිනොච්චි ගොවිජන සේවා කාරක සභාවේ ජපන් යෙන් ණය ආධාර යටතේ ට්‍රැක්ටර් මිලදී ගැනීම් සඳහා ලබාදුන් ණය මුදලින් අයකර තිබුණු රු.4,012,150 ක් කොමසාරිස් ජනරාල් වෙත ගෙවිය යුතු වූවත්, එම ගෙවිය යුතු මුදල රු.3,802,291 ක් ලෙස දක්වා තිබීමෙන් ජංගම වගකීම් රු.209,859 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි මුදල් වර්ෂයේදි නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | ගෙවියයුතු මුදල් නිශ්චිතව හඳුනාගෙන වගකීම් ලෙස ගිණුම් ගත කළ යුතු අතර, බැරකම් නිරවුල් කිරීමට පියවර ගත යුතුය. |
| (ඊ) | පලෙයි ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්තව ප්‍රකාශයේ ගොවිජන බැංකුවෙන් ලැබිය යුතු ලාභාංශ රු.104,339 ක් ලෙස දක්වා තිබුණද, ගොවිජන බැංකුවේ අවසන් ගිණුම්වල එය රු. 234,424 ක් ලෙස දක්වා තිබීමෙන් රු.130,085 ක නොසැසඳීමක් විය. | 2025 වර්ෂයේ අවසන් ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාළ ශේෂ සැසඳීම් කර ලැබිය යුතු නිවැරදි ලාභාංශය වාර්ෂික ගිණුම්වල දැක්වීමට කටයුතු කළ යුතුය . |
| (උ) | අක්කරායන්කුලම් ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්ය සාධන වාර්තාවේ ගොවි සංවිධානවලින් ලැබිය යුතු රෝද 04 ට්‍රැක්ටර් ආදායම් ලෙස රු.210,000 ක් දැක්විය යුතු වූවද, ආදායම් ලෙස රු.80,000 ක් පමණක් දක්වා තිබීමෙන් අතිරික්තය හා ලැබිය | ඉදිරි මූල්‍ය වර්ෂයේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.. | වර්ෂයට අදාළ ලැබිය යුතු ආදායම් නිවැරදිව දක්වා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | යුතු ආදායම් රු.130,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ඍ) | පුනහරි ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේ කන්න ගොවීන් සඳහා නිකුත් නොකළ එකතුව රු.2,243,830 ක් වටිනා සහනාධාර පොහොර මෙට්රික් ටොන්13.19 ක් මධ්‍යස්ථාන ගබඩාවේ රඳවා ගෙන තිබුණි. එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලද දක්වා නොතිබුණු බව නිරීක්ෂණය විය. | නියමිත වටිනාකම සමාගම විසින් දැනුම් දී නොතිබුණු හෙයින් ගිණුම් ගත කිරීමට කටයුතු නොකළෙමි. | ගබඩාවේ ඇති සහනාධාර පොහොර තොගය ගිණුම්ගත කළ යුතුය. |
| (එ) | පරන්දන් ගොවිජන සේවා කාරක සභාවට අයත් 2022 වර්ෂයේ ඉදි කරන ලද රු.4,470,000 ක් වටිනා ගොඩනැගිලි ගිණුම් ප්‍රකාශවල දක්වා නොතිබුණි. | තක්සේරු කළ ගිණුම් ගත කිරීමට කටයුතු කළෙමි. | ගොඩනැගිලි වල වටිනාකම් ගිණුම්ගත කළ යුතුය. |
| (ඒ) | කන්ඩාවලෙයි ගොවිජන සේවා කාරක සභාව විසින් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත ගෙවිය යුතු පොහොර සහනාධාර මුදල වන රු.958,789 ක් කාරක සභාවේ ආදායම් වශයෙන් දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ වියදම් ඉක්මවූ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණ අතර, බැරකම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම මුදල නිශ්චිත වශයෙන් කොමසාරිස් ජනරාල් වෙත ගෙවිය යුතු මුදලක් ලෙස දැනුවත් වී නොතිබුණු හෙයින්, මෙසේ ගිණුම්ගත කිරීමට කටයුතු කෙළෙමි. | ගොවිජන සේවා කොමසාරිස් වෙතින් ලද සහනාධාර පොහොරවල පිරිවැය වටිනාකම ආපසු ගෙවීමට හැකිවන පරිදි ගිණුම්වල ගැලපීම් කළ යුතුය. |

**1.3.3 විගණන සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 06 ක සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශවල දක්වා තිබූ ලැබිය යුතු ශේෂ 32ක එකතුව රු.10,881,758 ක් සඳහා ඒවා සනාථ කිරීමට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි මුදල් වර්ෂයේ ලැබිය යුතු ශේෂ සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ලැබිය යුතු ගිණුම් ශේෂ තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 06 ක සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශවල දක්වා තිබූ ගෙවිය යුතු ශේෂ 32 ක එකතුව රු.26,165,595 ක් වෙනුවෙන් ගෙවිය යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි මුදල් වර්ෂයේ ගෙවිය යුතු ශේෂ සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ගෙවිය යුතු ගිණුම් ශේෂ සඳහා ගෙවිය යුතු ණය හිමියන්ගේ නම් ඇතුළත් උපලේඛන හා ශේෂ සනාථ කිරීම් සටහන් ලෙස |

| | | | |
|---|---|---|---|
| | | | විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 06 ක කුඹුරු ඉඩම් හෙක්ටයර් 22,817 ක් වෙනුවෙන් අක්කර බදු රු.5,080,127 ක් අයකර ඇති බව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, කුඹුරු ඉඩම් නාම ලේඛන විගණනයට ඉදිරිපත් නොකිරීමෙන් අක්කර බදු සහ ලැබිය යුතු අක්කර බදු පිළිබඳ සනාථ කිරීමට නොහැකිව ඇත. | දැනට කෙටුම්පත් කුඹුරු ඉඩම් නාම ලේඛනයක් පිළියෙල කර යාවත්කාලීන කර ඇත. එම ලේඛන අනුව 2024 වර්ෂය සඳහා අක්කර බදු ලේඛනයද පිළියෙල කර යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ආදායම් තහවුරු කිරීම සඳහා අදාළ ලේඛන යාවත්කාලීන කර පවත්වා විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | ගොවිජන සේවා කාරක සභා 05 ක් විසින් අවස්ථා 280ක දී රු.28,455,433 ක් වටිනා චෙක්පත් නිකුත් කර තිබුණද, චෙක්පත් නිකුත් කිරීමේ ලේඛන නිසි පරිදි සම්පූර්ණ කර අවශ්‍ය විස්තර ඇතුලත් කර සකස්කර නොතිබුණි. | සමහර අවස්ථාවල චෙක්පත් තැන්පත් කරන අතර, අතින් භාර දෙන අවස්ථාවේදි පමණක් අත්සන් ලබා ගෙන ඇත. | චෙක්පත් නිකුත් කිරීමේ ලේඛන නිසිපරිදි පවත්වා ගෙන යා යුතු අතර, එසේ නොකළ නිලධාරීන්ට පියවර ගත යුතුය. |
| (ඉ) | කිලිනොච්චිය ගොවිජන සේවා කාරක සභාව සතු රු.මිලියන 19.2 ක් වටිනා ගොඩනැගිල්ල මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, එහි අයිතිය සනාථ කිරීමට අවශ්‍ය ලියවිලි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ තක්සේරු කටයුතු 2023 වර්ෂයේ සිදු කර ඇත. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් එම ලියවිලි ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වත්කම්වල අයිතිය තහවුරු කරන ලියවිලි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ඊ) | පූනකරි ගොවිජන සේවා කාරක සභාවේ රු.977,499 ක ස්ථාවර තැන්පත් පවතින බවට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්කර ඇතත්, ඒ සඳහා එම ස්ථාවර තැන්පත් සහතිකය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2008 යුධමය අවස්ථාවේ විනාශවී ඇත. මහ බැංකුව මගින් ලබා ගැනීම් කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ස්ථාවර තැන්පත් අදාල බැංකු මගින් තහවුරු කර ගෙන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**1.4 අනුකූල නොවීම**

**1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත | | | |
| i | 44 (1) වගන්තිය | පනත අනුව, ගොවිජන සේවා කාරක සභා 06 ක ගොවි සංවිධානවල ගිණුම්, ගොවිජන සේවා කොමසාරිස් ජනරාල් විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් පරීක්ෂා කළ යුතු බව සඳහන් වුවද, එසේ ගිණුම් පරීක්ෂා කර නොතිබුණි. | ඉදිරියේදි ගිණුම් පරීක්ෂා කිරීමට කටයුතු කරනු ලැබේ. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු අතර, ඒ සඳහා විධිමත් වැඩපිළිවෙලක් සැකසිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| ii | 52 වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 10 ක ගොවිජන සංවර්ධන ප්‍රදේශය සඳහා කෘෂිකාර්මික සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | ප්‍රදේශයේ කෘෂිකාර්මික සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කර ඇත. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු අතර, එසේ නොකළ නිලධාරීන්ට පියවර ගත යුතුය . |
| iii | 55 වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 05 ක පරිපාලන ප්‍රදේශයේ පිහිටි කුඹුරු ඉඩම් මැනුම් කටයුතු කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් මැනීම් කටයුතු දැනට සිදුකරනු ලැබේ. | පනතේ විධිවිධාන අනුව කඩිනම් කටයුතු කළ යුතුය. |
| iv | 56 (i) වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 04 ක අක්කර බදු ලේඛන යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. | අක්කර බදු ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇත. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු අතර, එසේ නොකළ නිලධාරීන්ට පියවර ගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| i | මුදල් රෙගුලාසි 110(1) | ගොවිජන සේවා කාරක සභා 04 ක හානි හා පාඩු ලේඛනයක් පවත්වා නොතිබුණි. | හානි හා පාඩු ලේඛනය පවත්වා ගෙන යාමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 110(1) අනුව කටයුතු කළ යුතුයි. |
| ii | මුදල් රෙගුලාසි 214 | ගොවිජන සේවා කාරක සභා 09 ක බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | බැරකම් ලේඛනය පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 214 අනුව කටයුතු කළ යුතුයි. |
| iii | මුදල් රෙගුලාසි 880 හා 2020 ජුනි 25 දින අංක 08/2020 දරන චක්‍රලේඛය. | පලෙයි ගොවිජන සේවා කාරක සභාවේ ගොවිජන බැංකුවේ මුදල් ගනුදෙනු වලට සම්බන්ධ නිලධාරින් 39 දෙනෙකු විසින් ඇප තැන්පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | මුදල් රෙගුලාසි 880 අනුව කටයුතු කර ඇප තැන්පත් කළ යුතුයි. |
| iv | මුදල් රෙගුලාසි 891(1) | ගොවිජන සේවා කාරක සභා 02 ක ඇප තැන්පත් ලේඛනය පවත්වා ගෙන නොතිබුණි. | ඉදිරියේදී ඇප තැන්පත් ලේඛන පවත්වා ගෙන යාමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 891(1) අනුව කටයුතු කර ඇප තැන්පත් ලේඛන පවත්වා ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| v | මුදල් රෙගුලාසි 1646 | ගොවිජන සේවා කාරක සභා 02 ක ට්‍රැක්ටර් යන්ත්‍රයේ ධාවන සටහන් මුල් පිටපත් සහ මාසික කාර්ය සාධන සාරාංශය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ට්‍රැක්ටර් යන්ත්‍ර සඳහා ධාවන සටහන් පවත්වා ගෙන යාමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 1646 අනුව කටයුතු කළ යුතුයි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 19 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | කිලිනොච්චි ගොවිජන සේවා කාරක සභාවට අයත් වාහනවල ඉන්ධන දහන පරීක්ෂණ සිදුකර නොතිබුණි. | දැනට වාහනවල ඉන්ධන දහන පරීක්ෂණ සිදු කරමින් පවති. | ඉන්ධන දහනයේ කාර්යක්ෂමතාවය තහවුරු කරගැනීම සඳහා ඉන්ධන දහන පරීක්ෂණ සිදු කළ යුතුය. |
| (ඈ) | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ | | | |
| ii | 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරණ චක්‍රලේඛය | ගොවිජන සේවා කාරක සභා 06 ක ගොවිජන බැංකුවල වගකිය යුතු නිලධාරින්ගෙන් ඇප මුදල් ලබා ගෙන නොතිබුණි. | ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කර ඇත. | ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 10 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයේ එකතුව රු.4,436,586 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.10,950,317 ක් විය.ඒ අනුව දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 10හි මූල්‍ය ප්‍රතිඵලය රු.6,513,731 ක පසුබෑමක් නිරීක්ෂණය විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පූනකරි ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් සහ ජංගම වගකීම ලෙස පිළිවෙලින් දක්වා තිබූ රු.485,845 ක් සහ රු.181,125ක්වූ හඳුනා නොගත් ලැබියයුතු සහ ගෙවියයුතු ශේෂයන් නිරවුල් කිරීමේ කටයුතු කර නොතිබුණි. | පසු විපරම් කටයුතු සිදුකරන බව කාරුණිකව දන්වා සිටිමි. | ජංගම වත්කම් හා ජංකම වගකීම් යටතේ දක්වා තිබූ හඳුනා නොගත් ශේෂ කඩිනම් වැඩපිළිවෙලක් යොදා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කිලිනොච්චි ගොවිජන සේවා කාරක සභාවේ ජංගම නොවන වගකීම් සහ ජංගම වගකීම් යටතේ හඳුනා නොගත් ශේෂ පිළිවෙලින් රු.216,740 සහ රු.85,000 ලෙස එකතුව රු.301,740 ක් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | දිස්ත්‍රික් නියෝජ්‍ය කොමසාරිස්ගේ උපදෙස් අනුව අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | විධිමත් පරිදි පරීක්ෂා කර කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙතින් සහ උතුරු පළාත් සභාව වෙතින් 2011 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 08 කට ලබා දී තිබූ, රෝද හතරේ ට්‍රැක්ටර් රථ 93 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. | අයිතිය කඩිනමින් පවරා ගැනීම සඳහා කටයුතු සිදු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 04 කට අයත් රු.42,215,000 ක් වටිනා ගොඩනැගිලි සහිත ඉඩම් අයිතිය කාරක සභා වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගොඩනැගිලි වල තක්සේරු කිරීමේ කටයුතු 2023 වර්ෂයේදී නිම කර ඇති අතර, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරනු ලබන වත්කම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 08 ක ට්‍රැක්ටර් රථ 77 ක් වර්ෂ 15 ක වැඩි කාලය සිට භාවිතයෙන් ඉවත්කර තිබූ අතර ඒවා අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ට්‍රැක්ටර් රථවල අළුත්වැඩියා කටයුතු දැනට සිදු කරනු ලැබේ. | අළුත්වැඩියා කර භාවිතයට ගැනීම හෝ අලුත්වැඩියා කිරීම ආර්ථික වශයෙන් ඵලදායී නොවේ නම් විධිමත් අනුමැතිය යටතේ අපහරණය කිරීම කළ යුතුයි. |

**3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2012 වර්ෂයේ ජපාන යෙන් ව්‍යාපෘති යටතේ ගොවිජන සේවා කොමසාරිස් විසින් ගොවිජන සේවා කාරක සභා 02ක් වෙත ලබාදුන් රෝද දෙකේ ට්‍රැක්ටර් රථ වෙනුවෙන් ලැබිය යුතු හිඟ ණය රු.181,125 ක් වර්ෂ 13 ක් ගතවී ඇතත් අයකර ගෙන නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | කාලීනව ණය අය නොකළ නිලධාරීන්ට පියවර ගැනීමටත්, හිඟ ණය කඩිනමින් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2022 ජුනි 01 දිනැති අංක 7/5/12/11 දරන ලිපිය අනුව වෙනත් ආයතන සමග සිදුකළ ගනුදෙනු 2025 අගෝස්තු 25 දිනට ප්‍රථම නිරවුල් කළ යුතුවූවත්, ගොවිජන සේවා කාරක සභා 07 ක 2024 දෙසැම්බර් 31 දිනට ද අයවිය යුතු රු.13,990,671 ක් සහ ගෙවියයුතු රු.2,613,240 ක් සම්බන්ධයෙන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ලැබියයුතු හා ගෙවියයුතු මුදල් දිස්ත්‍රික් නියෝජ්‍ය කොමසාරිස් තුමාගේ උපදෙස් අනුව දිස්ත්‍රික් කාර්යාල මගින් නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | විධිමත් ක්‍රමවේදයක් යටතේ ගෙවියයුතු මුදල් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**4.** **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1** **වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 වන දිනැති අංක 02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 වන ඡේදය අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස්කළ යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 10 ක් එසේ සකස් කර නොතිබුණි. | ඉදිරි මුදල් වර්ෂයේ සිට වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

**5.** **ගොවිජන බැංකු කටයුතු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 10 ක් විසින් තම ගොවින් 156 දෙනෙකුට ලබා දී තිබූ වගා ණය වලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තවදුරටත් හිඟ ණය මුදලේ ශේෂ එකතුව රු.15,157,346 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය ශේෂය අය කරමින් පවති. . | කඩිනමින් හිඟ ණය අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු අතර, කාලීනව ණය අය කිරීමට කටයුතු නොකළ නිලාරීන්ට පියවර ගත යුතුය. |